## සංක්ෂිප්තය

ශ්‍රී ලංකාවේ පූර්වසේවා ගුරු පුහුණු ආයතනයක් වන ජාතික අධ්‍යාපන විද්‍යාපීඨයන්හි ක්‍රියාත්මක වන ඇගයීම් ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු විමසා බැලීම මෙම අධ්‍යයනයේ අරමුණ විය.

අධ්‍යාපන ක්‍රියාවලිය මානව සංවර්ධනය හා බැඳුණු ක්‍රියාවලියකි. එම ක්‍රියාවලිය මනාව ඵලදායි ලෙස මෙහයවීමට ශක්තියක් හා දැනුම කුසලතා ආකල්ප වලින් යුක්ත ගුරු වරයකු පූර්වසේවා ගුරු පුහුණු පාඨමාලාවලින් ක්ෂේත්‍රයට දායාද කරයි.

මෙම අධ්‍යයනයෙන් ප්‍රයත්න දැරුවේ ජාතික අධ්‍යාපන විද්‍යාපීඨවල ක්‍රියාත්මක වන්නා වූ ආයතනගත දෙවර්ෂ හා සීමාවාසී වර්ෂයේ ගුරු අභ්‍යාසලාභින් ගුරු වෘත්තියට පිවිසීමේදී ඔවුන්ගේ දැනුම ආකල්ප කුසලතා යනාදිය ඇගයීමට භාජනය වන ආකාරය සෙවීමටයි. ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ ඇගයීම් ක්‍රියාවලිය ක්‍රියාත්මක වන ආකාරය හා එහි ප්‍රබලතා මෙන්ම දුබලතා හඳුනාගැනීම අපේක්ෂාව විය.

පූර්වසේවා ගුරු පුහුණු කිරීම් ක්‍රියාවලියේ ඇගයීමේ විකාශනය අධ්‍යයනය කිරීම, වර්තමානයේ දියත් කර ඇති ඇගයීම් ක්‍රියාවලිය අධ්‍යයනය කිරීම, ක්‍රියාත්මක ඇගයීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයේ අරමුණු විය.

2003 - 2005 වසර වල අධ්‍යාපන විද්‍යාපීඨයට ඇතුළත් වූ ප්‍රාථමික හා කෘෂිකර්ම පාඨමාලාවල ගුරු අභ්‍යාසලාභින් 100 ක නියැදියක්ද කථිකාචාර්ය 40 කගේ හා උප පීඨාධිපති දෙදෙනෙකුගෙන් සමන්විත 142 දෙනෙකුගේ නියැදියක් තුළින් ජාතික අධ්‍යාපන විද්‍යා පීඨ දෙකක අධ්‍යයනය මෙහෙයවා ලබාගත් දත්ත ප්‍රතිශත මගින් විශ්ලේෂණයට ලක් කෙරිණි.

එහිදී ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ පූර්වසේවා ගුරු පාඨමාලාවේ ඇගයීම් ක්‍රමය අභ්‍යන්තර මෙන්ම බාහිරව සිදුවන බව තහවුරු කරගන්නා ලද අතර අභ්‍යන්තර ඇගයීම් වලදී බොහෝ දුරට ලිඛිත පැවරුම් වලට මුල් තැන හිමි වී ඇත. අන්තර් අභ්‍යන්තර පරීක්ෂණ එතරම් ඵලදායි ඇගයීම් ක්‍රමයක් ලෙසින් ක්‍රියාත්මකවීමේදී දක්නට නැත. විභාග දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන බාහිර පරීක්ෂණ සාර්ථක බව අනාවරණය විය.

මෙහිදී පූර්වසේවා ගුරු පාඨමාලාවේ ඇගයීම් ක්‍රම රාශියක් භාවිත නොකර ප්‍රධාන ක්‍රම දෙකක් හෝ තුනක් භාවිත කරන්නේ නම් සුදුසු බව නිගමනය විය. කාර්ය මූලික පර්යේෂණ සඳහා මඟ පෙන්වීම තවදුරටත් සිදු විය යුතුය. අනාගතයේදී ඵලදායි කාර්යක්ෂම ගුරුවරයකු බිහිකිරීමට පූර්ව සේවා පාඨමාලාවේ ඇගයීම් ක්‍රියාවලිය සාර්ථකව ක්‍රියාත්මක විය යුතුය යන්න මෙමගින් තහවුරු විය.